# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,533 - 2008 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2008.01.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 42 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 47 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 49 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ නරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ජනවාරි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජනවාරි මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 29

DRF/21/RECT/2519.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 මාර්තු මස 30 වන දින සිට කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) බෝගහවත්තගේ පසන් කුලරත්න, පීඑස්සී (නි/60003).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 මාර්තු මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කර්නල් බෝගහවත්තගේ පසන් කුලරත්න, පීඑස්සී (නි/60003).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

01-545

---

2008 අංක 30

DRF/21/RECT/2543.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජූනි මස 09 වන දින සිට ලුතිනන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) අජිත් කුමාර සියඹලාපිටිය, පීඑස්සී එල්එස්සී ශ්‍රීලයුපොහේබ (නි/60459).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජූනි මස 10 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් කර්නල් අජිත් කුමාර සියඹලාපිටිය, පීඑස්සී එල්එස්සී ශ්‍රීලයුපොහේබ (නි/60459).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-544

---

2008 අංක 31

DRF/21/RECT/2535.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජූනි මස 29 වන දින සිට ලුතිනන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සමරකෝන් රත්නායකලාගේ ප්‍රියදර්ශන රත්නායක, ආර්එස්පී ශ්‍රීලපාහ (නි/60733).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජූනි මස 30 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් කර්නල් සමරකෝන් රත්නායකලාගේ ප්‍රියදර්ශන රත්නායක, ආර්එස්පී ශ්‍රීලපාහ (නි/60733).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින,
කොළඹ දී ය.

01-541

DRF/21/RECT/2545.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙළීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල පහත හෙළීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 ජුනි මස 29 වන දින සිට කපිතන් නිලයට නිල පහත හෙළීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (තාවකාලික මේජර්) ජයසිංහ මුදියන්සේලාගේ උදය වසන්ත ගුණරත්න, ආර්එස්පී කරෙ(නි/63163).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 ජුනි මස 30 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් ජයසිංහ මුදියන්සේලාගේ උදය වසන්ත ගුණරත්න, ආර්එස්පී කරෙ(නි/63163).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-502

---

2008 අංක 32

DRF/21/RECT/2528.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් සමරවීර පටබැඳිගේ ශිරාන් දමිත් ප්‍රසන්න සමරතුංග, ශ්‍රීලයුයුබ (නි/64170).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-547

---

2008 අංක 33

DRF/RECT/1021/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් විධානය කරන ලද ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත සේවා මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරිනි 2007 නොවැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත සේවා මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් විධානය කර ඇත :

ලුතිනන් දලුවත්ගොඩ විතානගේ ඉමාලි නදීකා යාපා කුලතුංග, ශ්‍රීලයුවෙබ (නි/66265).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

01-551

---

DRF/21/RECT/2103.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමිය විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2005 මාර්තු මස 15 වැනි දින සිට අධිකාරියෙන්

ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමිය විසින් අනුමත කර ඇත :

දෙවැනි ලුතිනන් වීරකොන්ඩ ආරච්චිගේ රොහාන් ලාල් ද සිල්වා, විපාරෙ (නි/64255).

අතිගරු ජනාධිපති උතුමියගේ අණ පරිදි,

මේජර් ජෙනරාල් අසෝක කේ. ජයවර්ධන,
ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2005 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

01-550

---

2008 අංක 34

DIRF/RECT/227/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2007.06.16 දින සිට පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබීම සහ එදිනම සිට ඔවුන්ගේ නම ඉදිරියෙන් පෙන්වා ඇති රෙජිමේන්තුව/බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

01. සී/56640 කෙඩෙට් නිලධාරි - තල්අරඹ විතානගේ ධනුෂ්ක දිනෙත් වීරතුංග - ගැමුණු හේවා බලඇණිය
02. සී/56574 කෙඩෙට් නිලධාරි - චමින්ද සිරිවර්ධන - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
03. සී/56555 කෙඩෙට් නිලධාරි - හෙට්ටියා දුරගේ රුවන් චාමර ප්‍රනාන්දු - විජයබාහු පාබල රෙජිමේන්තුව
04. සී/56631 කෙඩෙට් නිලධාරි -කුඩා විදානගේ උපුල් නුවන් ආරියතිලක - විජයබාහු පාබල රෙජිමේන්තුව
05. සී/56655 කෙඩෙට් නිලධාරි - බාලසූරිය මුදියන්සේලාගේ චලිත දනුෂ්ක සෙනරත් බාලසූරිය - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
06. සී/56638 කෙඩෙට් නිලධාරි - අංගගේ බෙනඩික් ක්‍රිශාන් පීරිස් වික්‍රමරත්න - ගජබා රෙජිමේන්තුව
07. සී/56657 කෙඩෙට් නිලධාරි - මීමනගේ සම්පත් සුරංග පෙරේරා - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය
08. සී/56567 කෙඩෙට් නිලධාරි - මත්තුමගල කංකානමලාගේ මාර්ක් තරංග අල්විස් - ශ්‍රී ලංකා පාබල හමුදාව
09. සී/56639 කෙඩෙට් නිලධාරි - නයනකාන්ත කළුආරච්චි - සන්නද්ධ බුද්ධි බළකාය
10. සී/56641 කෙඩෙට් නිලධාරි - නායිමන විදානගේ ලක්මාල් දිනූෂ - ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව
11. සී/56554 කෙඩෙට් නිලධාරි - බුවනකබාහු හිත්තර නයිදෙලාගේ බුද්ධික ප්‍රසාද් විමලරත්න - ගජබා රෙජිමේන්තුව
12. සී/56645 කෙඩෙට් නිලධාරි - වලිසුන්දර මුදියන්සේලාගේ සුරංග ඉෂාර චානක වලිසුන්දර - ගැමුණු හේවා බලඇණිය
13. සී/56643 කෙඩෙට් නිලධාරි - ගගේ ගෙදර රුවන් ධම්මික වනිගරත්න - ශ්‍රී ලංකා පාබල හමුදාව
14. සී/56647 කෙඩෙට් නිලධාරි - ජනක ජමිල කුමාර මීපාගල - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
15. සී/56644 කෙඩෙට් නිලධාරි - දෙනියේ ගෙදර කපිල හර්ෂ තිස්ස කුමාර - ගැමුණු හේවා බළඇණිය
16. සී/56632 කෙඩෙට් නිලධාරි - අකුරන්ගේ තිලින අසංක විමලවීර - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
17. සී/56634 කෙඩෙට් නිලධාරි - ගම ඇතිගේ ධර්මරත්න බංඩාර - ගැමුණු හේවා බළඇණිය
18. සී/56637 කෙඩෙට් නිලධාරි - අලවල දේවගේ සංජීව කපිල කුමාර - ගජබා රෙජිමේන්තුව
19. සී/56550 කෙඩෙට් නිලධාරි - වැලිගොඩ දසනායකලාගේ දුලිත් දම්මික දසනායක - ශ්‍රී ලංකා පාබල හමුදාව
20. සී/56635 කෙඩෙට් නිලධාරි - සුදුහකුරු දේවගේ අබේවීර - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
21. සී/56520 කෙඩෙට් නිලධාරි - එදිරිසිංහ ආරච්චිලාගේ විනෝජිත් රොෂාන් ද සිල්වා - විජයබාහු පාබල රෙජිමේන්තුව
22. සී/56650 කෙඩෙට් නිලධාරි - පින්නගොල්ලේ ගෙදර සුමිත් රත්නායක - ගජබා රෙජිමේන්තුව
23. සී/56658 කෙඩෙට් නිලධාරි - පනම්බර ආරච්චිලාගේ චාමිකර දිමුතු විජේසේකර - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
24. සී/56654 කෙඩෙට් නිලධාරි - පනියන්දුවගේ නදීක දර්ශන පනියන්දුව - විජයබාහු පාබල රෙජිමේන්තුව
25. සී/56630 කෙඩෙට් නිලධාරි - ඉද්දමල්ගොඩ මල්ලව ආරච්චිගේ බුද්ධික ඉද්දමල්ගොඩ - ශ්‍රී ලංකා පාබල හමුදාව.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

01-553

---

2008 අංක 35

DVF/RECT/22(VII)/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2006 ජූලි මස 19 දින සිට කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) අන්තිඤ්ඤා මරක්කල අජන්ත අමරසීල, ආර්එස්පී (නි/2119).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2007 ජුලි මස 20 දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කර්නල් අන්තිඤ්ඤා මරක්කල අජන්ත අමරසීල, ආර්එස්පී (නි/2119).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

01-546

---

2008 අංක 36

DVF/RECT/143(V)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ස්වේච්ඡා උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2003 නොවැම්බර් මස 04 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් බන්දුල සරත් ද සිල්වා, ශ්‍රීලපාහ, (නි/2155).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-549/2

---

2008 අංක 37

DVF/RECT/215AY(2).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 ජූනි මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :

මේජර් මොහිදීන් අලියාස් මොහොමඩ් අසාත්, ශ්‍රීලපාහ (නි/3187).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-542

---

2008 අංක 38

DVF/RECT/143(V)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ස්වේච්ඡා උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2002 අප්‍රේල් මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් ආනන්ද ජයවීර, ශ්‍රීලංඉ, (නි/2337).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-549/1

---

2008 අංක 39

DVF/RECT/143(V)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ස්වේච්ඡා උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2002 සැප්තැම්බර් මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් හපුතොටගම රාලලාගේ සුධර්ම හපුතොට, ශ්‍රීලංඉ (නි/2905).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-549/3

---

2008 අංක 40

DVF/RECT/260.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බල සේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2007 මැයි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :

කපිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) හක්මන විතාරණ පියසේන, ගැහේබ (නි/3353)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-543/1

---

2008 අංක 41

DVF/RECT/9AY(I).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2007 ජුනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :

කපිතන් පැළඳ අප්පුහාමිලාගේ ආරියරත්න, ශ්‍රීලයුපොදුසේබ (නි/2435).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-548

---

2008 අංක 42

DVF/RECT/260.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බල සේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2007 ජුනි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බල සේනාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් විජේසිංහ ආරච්චිගේ ප්‍රදීප් චන්දන පෙරේරා, ගරෙ (නි/4079).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-543/2

---

2008 අංක 43

DVF/RECT/143(V)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ස්වේච්ඡා උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 1998 අප්‍රේල් මස 27 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් බෝතලගේ ෆෙඩ්රික් ලෙස්ලි ඩෝනේශියස් ප්‍රනාන්දු, ශ්‍රීලංඉ (නි/2781).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

01-549/4

---

2008 අංක 44

DIVF/RECT/53/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම හා ඇතුළත් කිරීම

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරී 2006 නොවැම්බර් මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට ඉංජිනේරු සේවා බළකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කෙඩෙට් නිලධාරී නිලාන් චාමර සුවඳරත්න (සී/31820).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

01-552

2008 අංක 45

ඩී/ඒඑෆ්ජ්/37/01(ටී).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

2007 ජනවාරි මස 19 වන දින සිට පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට පෙර දක්වා ඇති නිලය යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරියට පත් කිරීමටත්, එදිනම සිටම ඔහුගේ නමට ඉදිරියෙන් ඇති ශාඛාවට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කොට ඇත :

ෆලයිං ඔෆිසර් කාලංචි දේවගේ කුසුම්සිරි ලාල් ජයන්ත ගු.තො. නි. (02611).

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

01-442

---

ඩී/ඒඑෆ්/577.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නෙරපා හැරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ගුවන් හමුදාවෙන් නෙරපා හැරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත :

ෆ්ලයිං ඔෆිසර් වාසලතන්ත්‍රීගේ චන්දිම ප්‍රියංකර වාසලතන්ත්‍රී (02007) කාර්මි/සංඥා 2007.02.02.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී 1ය.

01-445

---

# ආණ්ඩුවේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වෙනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941, අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත 1978 අංක 19 දරන පනත, ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත්

අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1), 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2007 දෙසැම්බර් මස 19 වැනි දින,
අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 40129 | මනිමෙල්දූර හේමරත්න දසිල්වා මයා., අංක 296, මහරුප්ප, කුලීගොඩ, අම්බලන්ගොඩ. | හොඳමුනි සෝමදාස ද සොයිසා සිරිවර්ධන මයා., පත්මා ලී බඩු වෙළඳ සැල, අංක 164/172, මහවීදිය, අම්බලන්ගොඩ. |
| (02) 40615 | වැවේගෙදර විමලසේන මයා, අංක 20, බලගහමුල, බලන්ගොඩ. | 1. වීරසේකර මුදියන්සේලාගේ කුඩා මහත්මයා මයා, තලකොලහින්න, මාවෙල, බලන්ගොඩ.<br>2. කෝවිල්තැන්නේ ටිකිරිරාළලාගේ නිමල් රාජකරුණා මයා, තලකොලහින්න, මාවෙල, බලන්ගොඩ. |
| (03) 40616 | වැවේගදර විමලසේන මයා අංක 20, බලගහමුල, බලන්ගොඩ | කෝවිල්තැන්නේ ටිකිරිරාළලාගේ නිමල් රාජකරුණා මයා, තලකොලහින්න, මාවෙල, බලන්ගොඩ. |
| (04) 40723 | ගල්පඩිගෙදර සමන්ත ගල්පඩිගේ මයා., ඉහළගම, රඹත්ත, මාවතගම | දෙල්ගමුව මුදියන්සේලාගේ ජයසිංහ මයා, අංක 213, අරම්පොලවත්ත, මාවතගම |
| (05) 40757 | මුතුගල් පේඩිගේ පියදාස මයා, හේනේගෙදර, බල්ලපාන, උඩබාගේ, ගලිගමුව නගරය | නිලන්ති ඇන්ඩර්සන් මිය, කවුඩුගම, හෙට්ටිමුල්ල |
| (06) 40783 | ගම්හේවාගේ සෝමාවතී මල්ලිකා මිය.. අංක 09, අක්කර 28, දඩවින්න, වැලිමඩ | මොහොම්මදු හනීෆා ෆවුසුල් ඉනායා මිය., අංක 6/1, රතඹ, අඹගස්දෝව |
| (07) 40787 | කලහේ ජාගොඩගේ ගිහාන් තිලකරත්න මයා., 109 බී, කොලමැදිරිය, බණ්ඩාරගම | විතානගේ ජොස්ලින් ප්‍රේරා මිය, මහජන මාවත, ගැලනිගම, බණ්ඩාරගම. |

01-433

---

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "පසන්-දෙව්නි සමරු පදනමේ දිළිඳු දරුවන් සඳහා වූ අධ්‍යාපන සහ වෛද්‍යාධාර අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, කොළඹ 01.

උපලේඛනය

"පසන් - දෙව්නි සමරු පදනමේ දිළිඳු දරුවන් සඳහා වූ අධ්‍යාපන සහ වෛද්‍යාධාර අරමුදල".

01-478

---

CH/O/5834.

**1980 අංක 56, 1977 අංක 09, 1976 අංක 18, 1974 අංක 34 දරන නිවාස දේපල උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතියෙන් සංශෝධිත 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිමය නීතිය**

*17 අ(1) වගන්තිය යටතේ නියෝගය* :

ඉහත කී පරිදි සංශෝධනය කරන ලද 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිමය නීතියේ 17 අ (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික නිවාස කොමසාරිස් තැන්පත් පහලගමගේ ගාමිණී ධර්මසේන වන මම, ගරු නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගේ ලිඛිත අනුමැතිය ඇතිව මේ සමග ඇති උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති නිවාසවල අයිතිය මින් අවසතු කරන අතර, එම නිවාස කිසි කලෙකත් මා වෙත පැවරී නොතිබුණු බවට සලකන බව ද, තවදුරටත් ප්‍රකාශ කරමි.

පහලගමගේ ගාමිණී ධර්මසේන,
ජාතික නිවාස කොමසාරිස්.

2007 දෙසැම්බර් මස 17 වැනි දින,
නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

උපලේඛනය

1 කොළඹ 13, කොටහේන ශාන්ත ලුසියා වීදිය, අංක 52 දරන නිවස
2 කොළඹ 13, කොටහේන ශ්‍රී ගුණානන්ද මාවත, අංක 178 දරන නිවස
3 කොළඹ 13, කොටහේන ශ්‍රී ගුණානන්ද මාවත, අංක 180 දරන නිවස
4 කොළඹ 13, කොටහේන ශ්‍රී ගුණානන්ද මාවත, අංක 182 දරන නිවස.

මේ සම්බන්ධ ජාතික නිවාස කොමසාරිස් විසින් නිකුත් කරන ලද 1995.10.22 දරන ලිපිය මින් අවලංගු කෙරේ.

01-456

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**මහජන බැංකුව - ගාල්ල මහවීදිය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2006.10.12 දින සහතික කරන ලද අංක 960 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, උඩුවක හේව්ගේ කුලතුංග යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එකොලොස් ලක්ෂ හැට හය දහස් හයසිය හැටහයයි ශත හැට අටක (11,66,666.68) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2007.02.21 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් එකොළොස් ලක්ෂ හැට හය දහස් හයසිය හැටහයයි ශත හැට අටක(11,66,666.68) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එකොලොස් ලක්ෂ හැටහය දහස් හයසිය හැටහයයි ශත හැට අටක (11,66,666.68) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 960 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මජහන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාව තුළ, හැලිවල පිහිටි හාලියාදෙනියදූව *හෙවත්* දෙල්ගහදූව කැබැල්ල නමැති ඉඩමේ අංක 3 දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු කේ. ඩී. එන්. වීරසිංහ මහතාගේ 1999.10.28 දිනැති අංක 704 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේම කැබලි අංක 2 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම කැබලි අංක 4 සහ 7 ද, දකුණට : දෙල්පතකුඹුර *නොහොත්*දූව අද්දර කුඹුර සහ බස්නාහිරට : මෙම ඉඩමේම කොටසක් ද, යන මායිම් තුල පිහිටි පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.50) විශාල ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේ ද වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 648/101 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 704 දරන පිඹුරට අනුව අංක 7 සහ 12 දරන කැබැලි පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

01-564

LE/RE/201.

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230000607.

ණයකරුගේ සම්පූර්ණ නම : කුරුම්බල පිටියගේ චන්දන සහ පල්ලිමුල්ල කපුගමගේ රම්‍යා ජානකී.

කොටුගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එම්. එන් මිඩොන්සා විසින් ලියා සහතික කරන ලද අංක 378 හා 1999.02.28 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ නවදහස් දෙසීය විසිඅටයි ශත අසූනවයක (රු. 2,09,228.89) මුදලක් වර්ෂ 2007.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතු ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැටදහස් හයසිය තිස්පහයි ශත හතළිහක (රු.1,60,635.40) මුදලද වර්ෂ 2007.07.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස්අට දහස් පන්සිය අනූතුනයි ශත හතළිස් නවයක (රු.48,593.49) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ නවදහස් දෙසීය විසිඅටයි ශත අසූනවයක (රු.2,09,228.89) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැටදහස් හයසිය තිස්පහයි ශත හතළිහක (රු.1,60,635.40) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොළියක් 2007.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ ඔක්තෝබර් මස 02 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, නැඩගමුව ග්‍රාමයෙහි පිහිටි හිග්ගහවත්ත නමැති ඉඩමට 1998.03.01 සහ 1998.02.15 දින එස්. පී. එන්. සඳගිරි මානක තැන විසින් මැන සම්පාදිත පිඹුරු අංක 200 හි ලොට් 1 ට මායිම්, උතුරට : එල්. බී. ජයවර්ධනට අයත් ඉඩම ද, නැගෙනහිරට : එන්. ඒ. පීටර් අප්පුහාමිට අයත් ඉඩම ද, දකුණට : පාර ද, බටහිරට : ඒ. ඩී. ප්‍රේමදාසට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිතුනයි දශම පහක (අ.0, රූ. 0, පර්. 23.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A244/164 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

01-567

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මාලඹේ ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 09 යටතේ ලියාපදිංචි කර ඇත

ගිණුම් අංකය : 0670-560037-001.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය :

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 දෙසැම්බර් 6 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2002 නොවැම්බර් 8 දිනැති අංක 1707 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අතුරුගිරිය පදිංචි කුෂාන් රාජපක්ෂ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක් කෝටි අට ලක්ෂ තිස් පන් දහස් දෙසීය පනහයි හත හැට හතක (රු.1,08,35,250.67) මුදලක්, 2007 අප්‍රේල් 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,08,35,250.67 මුදල ද, 2007 මැයි 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1707 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ නාවල පිහිටි බලයලත් මිනින්දෝරු බී. කේ. බී. ඕකන්දපොල විසින් සාදන ලද 1988 මැයි 8 දිනැති අංක 56/1988 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අළුබෝගහවත්ත හෙවත් ගොඩඋඩවත්ත දැන් ලියනගේ මාවත වරිපනම් අංක 8/22ඒ දරන ඉඩමෙහි කැබලි අංක $12^1$ ලකුණු කළ බලයලත් මිනින්දෝරු එච්. දොන් ඩේවිඩ් විසින් සාදන ලද 1951.09.17 දිනැති අංක 4551 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක ඒ ලකුණු කළ ඉඩම් කැබැල්ලෙන් කොටසක් වන බලයලත් මිනින්දෝරු ඩී. ඒ. මැන්ඩිස් විසින් සාදන ලද 1970.10.03 දිනැති අංක 1507 දරන සැලැස්මේ පෙන්නුම්කරනු ලබන කැබැලි අංක 12 හි නැවත මැනීමක අතුරු බෙදිමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : සුදර්ශණ මාවත වරිපනම් අංක 15 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : අංක 56/1988 දරන මෙම සැලැස්මේ කැබලි අංක $12^2$ ද, දකුණට : ලියනගේ මාවත සහ බස්නාහිරට : ලියනගේ මාවත වරිපනම් අංක 8/20 ද දරන පරිශ්‍රය ද යන මායිම් තුළ එකී අංක 56/1988 දරන සැලැස්ම අනුව පර්චස් එකොළහක් (අක්. 0, රූ. 0, පර්. 11) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, දැන් එම් 2633/136 ට ගෙනගොස් ඇති හිමිකම් එම් 1369/239 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති

01-569

---

LE/RE/201.

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2400000454.

ණයකරුගේ සම්පූර්ණ නම : හෙට්ටි ආරච්චිලාගේ දයා හර්ෂප්‍රිය ගුණරත්න.

